## ශ්‍රී ලංකා වරාය අධිකාරිය
## දැන්වීමයි

මගේ අංකය: මාසකො/විධා/06/112(i)

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති කම තනතුරේ ස්ථිර වූ මෙම අධිකාරියේ සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01 තනතුර : කණිෂ්ඨ කළමනාකරු (සංඛ්‍යාලේඛන) (කණිෂ්ඨ කළමනාකරණ මට්ටම) – JLM**

I. **වැටුප් කාණ්ඩය: (JLM 2)**

මූලික වැටුප : රු. 75,065/=
වැටුප් වර්ධකය : රු. 1,440/=

II. **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ව්‍යාපාර පරිපාලනය / අලෙවිකරණය/ කළමනාකරණය/ වාණිජ්‍ය/ ආර්ථික විද්‍යාව/ සංඛ්‍යානය/ ගණිතය/ අදාල විෂයන් සහිත උපාධියක්

**හෝ**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හා පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාල ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමාව කාල සීමාව වසර එක (01) ක් විය යුතුයි)

**සමඟ**

**පළපුරුද්ද**
වරාය අධිකාරියේ වසර තුන (03) ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම

**හෝ**

(ආ) පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාල ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමාව කාල සීමාව වසර එක (01) ක් විය යුතුයි)

**සමඟ**

**පළපුරුද්ද**
වරාය අධිකාරියේ වසර පහ (05) ක සක්‍රීය සේවා කාලයක් සහිත SG වැටුප් කාණ්ඩයේ අයෙකුවීම

**හෝ**

(ඇ) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි විෂයන් සම්මාන සහිතව සමත්වීම

**සමඟ**

**පළපුරුද්ද**

වරාය අධිකාරියේ වසර දහය (10) ක සක්‍රීය සේවා කාලයක් සහිත SG වැටුප් කාණ්ඩයේ අයෙකුවීම

**තෝරා ගැනීමේ විශේෂ නිර්ණායක**
කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමක තිබිය යුතුයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියළුම නීති රීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළ යුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි දිවයිනේ ඕනෑම පෙදෙසක හෝ අධිකාරියේ ඕනෑම කොට්ඨාශයක/ අංශයක සේවය කිරීමට බැඳී සිටී.

ආදර්ශ ආකෘතිපත්‍ර ප්‍රකාරව සකසන ලද අයදුම්පත් 2024-07-19 වෙනි දින හෝ ඊට පෙර ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත ලැබෙන සේ අදාළ කොට්ඨාශ/ අංශ ප්‍රධානියා මගින් එවිය යුතු වේ. ඒ සමඟ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත්ද අමුණා එවිය යුතු අතර, අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් හා මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අයුරින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රමාදවීමට තුඩුදුන් කරුණු අදාළ කොට්ඨාශ ප්‍රධානීන් විසින් සඳහන් කළයුතු අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)**
2024-06 28 වෙනි දින.
මානව සම්පත් කොට්ඨාශයේදීය.